# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

## Primary Piriven Year End Term Test - 2016

### 5 වසර / Grade 5

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

සමාජ විද්‍යාව
**Social Science**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ **I වන කොටසේ ප්‍රශ්න සියල්ලටත් , II වන කොටසින් ප්‍රශ්න හතරකටත් පිළිතුරු ලියන්න.**

**I කොටස**

**01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. ආරම්භක සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකුගේ නම් ලියන්න.

ii. 'ආගමේ මූලික ස්වරූප' ගැන ලියූ ආරම්භක සමාජ විද්‍යාඥයා නම් කරන්න.

iii. පුද්ගලයකුට හිමිවන සහ ලබාගත හැකි තත්ත්ව දෙක කුමක් ද?

iv. අපරාධ විද්‍යාවේ පියා කවු ද?

v. 'ශ්‍රම විභජනය' යන කෘතිය කාගේ ද?

vi. සමාජ පරිණාමය පිළිබඳ ඉගැන්වෙන සූත්‍ර දෙකක් ලියන්න.

vii. දිගු කාලීනව සමාජය වෙනස් කරන බලවේග දෙකක් නම් කරන්න.

viii. සියලු ම අපරාධ අවසන් වශයෙන් බෙදා ඇති කොටස් දෙක ලියන්න.

ix. සමාජ පරිණාමයේ ප්‍රධාන අදියර දෙක නම් කරන්න.

x. සමාජ සංස්ථා දෙකක් නම් කරන්න.

( ලකුණු 4 × 10 = 40 )

## II කොටස

02. i. සමාජ විද්‍යාව අධ්‍යයනයෙන් ලැබෙන ප්‍රධාන ප්‍රතිඵලය කුමක් ද? ( ලකුණු 04 )

ii. සමාජයක් යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. ( ලකුණු 05 )

iii. බෞද්ධ සමාජ විද්‍යාවක් ගොඩ නැගීමට ගතහැකි පියවර මොනවා දැයි පහදන්න. ( ලකුණු 06 )

03. i. වෙනස්වීම නම් ක්‍රියාවලියේ ආකාර තුන නම් කරන්න. ( ලකුණු 04 )

ii. සමාජ පරිණාමය යනු කුමක් ද? ( ලකුණු 05 )

iii. බුදු දහම ඇසුරින් සමාජය පරිණාමය වූ ආකාරය පැහැදිලි කරන්න. ( ලකුණු 06 )

04. i. සංස්කෘතිය පිළිබඳ නිර්වචනයක් ලියන්න. ( ලකුණු 04 )

ii. සංස්කෘතික ලැග්ම යනු කුමක් ද? ( ලකුණු 05 )

iii. බෞද්ධ සංස්කෘතිය වෙනස් වීමට සමාජයේ බලපෑම පිළිබඳ කරුණු දක්වන්න. ( ලකුණු 06 )

05. i. පැරණි සමාජ ලක්ෂණ හතරක් නම් කරන්න. ( ලකුණු 04 )

ii. පංචශීල ප්‍රතිපත්තියේ වැදගත්කම අගයන්න. ( ලකුණු 05 )

iii. නිවැරදි රාජ්‍ය පාලනයකට බුදුදහම බලපාන අයුරු විස්තර කරන්න. ( ලකුණු 06 )

06. i. සප්ත අපරිහාන ධර්ම හතරක් නම් කරන්න. ( ලකුණු 04 )

ii. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. ( ලකුණු 05 )

iii. ස්වයං පාලනයක් සඳහා බෞද්ධ භාවනා ක්‍රම දෙක කෙතරම් දුරට වැදගත් දැයි පහදන්න. ( ලකුණු 06 )

07. i. සමාජ ප්‍රශ්න හතරක් නම් කරන්න. ( ලකුණු 04 )

ii. ඉන් එක් සමාජ ප්‍රශ්නයක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. ( ලකුණු 05 )

iii. සමාජ ප්‍රශ්න ඇති නොවීමට ගත හැකි පියවර මොනවා දැයි පහදන්න. ( ලකුණු 06 )